### විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා නම් කිරීම

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**1) <u>සාමාජිකයාගේ තොරතුරු</u>**

1. සාමාජිකයාගේ සම්පූර්ණ නම : ....................................................................................................
2. ස්ථිර ලිපිනය: ....................................................................................................................
3. අර්ථසාධක අරමුදල් අංකය: ..........................................................................................
4. තනතුරු නාමය: ..................................................................................................................
5. විශ්වවිද්‍යාලය හෝ උසස් අධ්‍යාපන ආයතනයේ නම : ..............................................................

**1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 93(2අ) වගන්තිය යටතේ නම් කිරීම**

| | සම්පූර්ණ නම සහ ලිපිනය | ජාතික හැඳුනුම්පත් අංකය | ඥාති සම්බන්ධය | කොටස % |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |
| 5 | | | | |
| 6 | | | | |

............ ........................................
සාමාජිකයාගේ අත්සන

ඉහත නම සඳහන් මම මෙහි ඉහත වගුවෙහි නම් සඳහන් තැනැත්තා /තැනැත්තන්....................(සංඛ්‍යාව අකුරෙන්) මගේ විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලෙන් මට ගෙවිය යුතු මුදල මාගේ මරණයෙන් පසු ලබාගැනීමට හිමිකම ඇති තැනැත්තා/ තැනැත්තන් වශයෙන් මෙයින් නම් කරමි.

තවද නම් කිරීම් වලට අදාළ රීති සම්බන්ධයෙන් මීට අමුණා ඇති මාර්ගෝපදේශද මා විසින් කියවා තේරුම් ගෙන පහත සාක්ෂිකරුවන් ඉදිරිපිට 20....../....../.... දින ................................................................. දී අත්සන් කරන ලදි.

.................................................
සාමාජිකයාගේ අත්සන

| | |
|---|---|
| ............................................................ | ............................................................ |
| 1 වන සාක්ෂිකරුගේ අත්සන | 2 වන සාක්ෂිකරුගේ අත්සන |
| දෙපාර්තමේන්තු/ශාඛා ප්‍රධානියා (නිල මුද්‍රාව තැබිය යුතුය) | විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ සාමාජිකයෙක් |
| නම.................................................................... | නම.................................................................... |
| ජාතික හැඳුනුම්පත් අංකය.................................... | ජාතික හැඳුනුම්පත් අංකය.................................... |
| පදවිනාමය........................................................... | පදවිනාමය........................................................... |
| විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් අංකය.................. | විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් අංකය.................. |

## 2) <u>ආයතන ප්‍රධානියාගේ සහතිකය</u>

විශ්‍රාම වැටුප් අරමුදලේ අංකය.........................වන ............................................................................. මයා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ සේවා නියුක්තිකයකු බවත්, ඉහත දැක්වෙන නම් කිරීම/නම් කිරීම් එකී සේවා නියුක්තිකයා විසින් කරන ලද බවත්, ඉහත දක්වා ඇති විස්තර සත්‍ය හා නිවැරදි බවත් මෙයින් සහතික කරමි.

| | |
|---|---|
| ......................................................... | .......................................... |
| ලේඛකාධිකාරි | ආයතන ප්‍රධානියා |
| නම:......................................................... | නම:......................................................... |
| ජාතික හැඳුනුම්පත් අංකය: ........................ | ජාතික හැඳුනුම්පත් අංකය: ........................ |

**නිල මුද්‍රාව තැබිය යුතුය.**

# විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල

**<u>දායකයා විසින් තබා ගත යුතුය</u>**

**<u>විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල සඳහා නම් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ සහ රීති</u>**

1) නම් කිරීමක් සිදු කිරීමට අපේක්ෂා කරන යම් දායකයකු විසින්-

   (අ) ඔහු විවාහක තැනැත්තෙකු නම්, ඔහුගේ කලත්‍රයා හෝ දරුවන් එක්ව හෝ වෙන් වෙන්ව නම් කරනු ලැබිය යුතු ය;

   (ආ) ඔහු අවිවාහක තැනැත්තෙකු නම්, වෙනත් යම් තැනැත්තෙකු නම් කරනු ලැබිය යුතුය.

2) කිසිදු නම් කිරීමක් සිදු කිරීමට අපේක්ෂා නොකරන යම් දායකයකු, නම් කිරීමක් නොමැති බවට නම් කිරීමේ ලැයිස්තුවේ නිශ්චිතව සඳහන් කරමින් ස්වකීය අදහස ප්‍රකාශ කළ යුතුය.

3) නම් කිරීමක් සිදු කරනු ලබන දායකයා මිය යාමට පෙරාතුව අවස්ථාවෝචිත පරිදි, එම නම් කිරීම සකස් කර කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත හෝ අදාල උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධානියා වෙත භාරදී ඇත්නම් මිස එවැනි නම් කිරීමක් වලංගු හෝ නීතියෙන් බලාත්මක නොවන්නේය.

4) සෑම නම් කිරීමේ ආකෘති පත්‍රයක් ම, කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ දායකයා සේවයේ නියුක්තව සිටින අංශයේ හෝ ශාඛාවේ ප්‍රධානියා ඉදිරිපිට දී සහ එම දායකයාගේ අත්සනට සාක්ෂි දරනු ලබන තවත් දායකයකු ඉදිරිපිට දී අත්සන් කරනු ලැබිය යුතුය.

5) යම් තැනැත්තෙකුට අත්සන් කිරීමට නොහැකි වන අවස්ථාවක දී, ඔහුගේ අත්සන වෙනුවට කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයේ දායකයා සේවයේ නියුක්තව සිටින අංශයේ හෝ ශාඛාවේ ප්‍රධානියා ඉදිරිපිට දී ස්වකීය වම් මහපට ඇඟිලි සලකුණ තැබිය යුතු අතර එම මහපට ඇඟිලි සලකුණ එම නම් කිරීම සිදු කරනු ලබන තැනැත්තාගේ මහපට ඇඟිලි සලකුණ බවට තවත් දායකයකු විසින් එම නම් කිරිමේ පත්‍රයේ සහතික කරනු ලැබිය යුතු ය.

6) කිසිදු දායකයකුගේ නම් කල තැනැත්තකු, දායකයකුගේ අත්සන හෝ මහපට ඇඟලි සලකුණ සඳහා සාක්ෂි දැරීම හෝ සහතික කිරීම සඳහා සුදුස්සකු නොවිය යුතුය.

7) එක් තැනැත්තෙකුට වැඩි තැනැත්තන් ගණනක් නම් කර ඇති අවස්ථාවක දී, අදාල ප්‍රතිලාභ නම් කළ තැනැත්තන් අතර බෙදනු ලැබිය යුතු අනුපාතය නම් කිරීම කරනු ලබන දායකයා විසින් නම් කිරීමේ ආකෘති පත්‍රයේ නිශ්චිතව දක්වනු ලැබිය යුතුය.

8) යම් දායකයකු විසින් සිදු කරන ලද යම් නම් කිරීමක එක් නම් කළ තැනැත්තෙකුට වඩා නම් කර ඇති සහ නම් කළ තැනැත්තන් සඳහා ගෙවිය යුතු කොටස් පිළිබඳ කිසිදු විධානයක් ලබා දී නොමැති අවස්ථාවකදී, ගෙවනු ලබන ප්‍රතිලාභ සමාන කොටස් වලින් එම නම් කළ තැනැත්තන් අතර බෙදනු ලැබේ.

9) (1.) පහත සඳහන් අවස්ථා වලදී නම් කිරීමක් වලංගු නොවන ලෙස සලකනු ලැබේ. එනම් -

(අ) නම් කළ තැනැත්තා මිය යෑම;

(ආ) නම් කළ තැනැත්තන් එක් අයකුට වැඩි ප්‍රමාණයක් සිටින අවස්ථාවක දී, නම් කිරීම කරන ලද දායකයාගේ ජීවිත කාලය තුළ දී එම එක් නම් කළ තැනැත්තකු මියයන අවස්ථාවක දී; හෝ

(ඇ) දායකයකු විවාහ වීමට පෙරාතුව දායකයා විසින් නම් කිරීමක් සිදුකර, ඉන්පසු ව එම දායකයා විවාහ වන අවස්ථාවක දී,

(2.) යම් දායකයකු විසින් සිදු කරන ලද නම් කිරීමක් වලංගු නොවන ලෙස සලකනු ලබන අවස්ථාවක දී, එම දායකයා විසින් අලුත් නම් කිරීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

10) (1.) අරමුදලේ දායකයකු නම් කළ තැනැත්තෙකු -

(අ) එම දායකයා විසින් අරමුදලට දායක මුදල් ගෙවනු ලබන කාල සීමාව තුළ දී එම නම් කිරීම සිදු කර ඇත්නම් පමණක් ; සහ

(ආ) එම දායකයාගේ මරණින් පසුව පමණක්;

අරමුදලින් ගෙවීම් ලබා ගැනීම සඳහා හිමිකම් ලබන්නේය.

(2.) දායකයකු මිය යන අවස්ථාවේ දී යම් නම් කළ තැනැත්තෙකු බාලවයස් කරුවකු වන විටක, එම නම් කළ තැනැත්තාට අරමුදලින් ගෙවිය යුතු ගෙවීම්,

(අ) එම මිය ගිය දායකයාගේ බූදලය සම්බන්ධයෙන් බූදල් නඩුවක් නොපවතී නම්, එම නම් කළ තැනැත්තාගේ නමට රජය අනුමත බැංකුවක පනතේ විධිවිධාන වලට යටත්ව එම මුදල් තැන්පත් කරනු ලැබේ.

හෝ

(ආ) මිය ගිය දායකයා ගේ බූදලය සම්බන්ධයෙන් බූදල් නඩුවක් විභාග වෙමින් පවතින අවස්ථාවක දී, අධිකරණය විසින් ආඥා කරනු ලබන ආකාරයට එම මුදල් තැන්පත් කරනු ලැබේ.

11) දායකයාගේ මරණය සිදුවන අවස්ථාවේ දී, වලංගු නම් කිරීමක් බලාත්මකව නොපවතී නම් නැතහොත් අවස්ථාවෝචිත පරිදි නම් කළ තැනැත්තා හෝ නම් කළ තැනැත්තන් මියගොස් ඇති අවස්ථාවකදී, අදාළ ගෙවීම් එම මිය ගිය දායකයාගේ නෛතික උරුමක්කරුවන් වෙත ගෙවනු ලැබේ.

12) අවිවාහක හෝ සේවා කාලය අවුරුදු 20 සම්පූර්ණ නොකළ දායකයකු මිය ගිය හොත් ඔහුගේ විශ්‍රාම වැටුප් ගිණුමෙහි බැරට ඇති දායක මුදල් හා පොළිය නිත්‍යානුකූල උරුමකරුවන්ට ආපසු ගෙවනු ලබන අවස්ථාවක දී පමණක් විශ්‍රාම වැටුප් අරමුදල් සඳහා කරනු ලබන නම් කිරීම යොදා ගනු ලැබේ.